ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

## අදියර II විභාගය - 2021 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

**මෙය ලකුණු 25 ක අනිවාර්ය ප්‍රශ්නයකි. නව විෂය නිර්දේශය යටතේ උසස් මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැයකරණය දැනුම පරීක්ෂා කර තිබේ. ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබූ අතර බොහෝ අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්ණය සඳහා ලකුණු 10-25 අතර ප්‍රමාණයක් ලබාගෙන තිබේ.**

අයදුම්කරුවන්ගේ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේදී පොදුවේ නිරීක්ෂණය වූ අඩුපාඩු පහත පරිදි විය:

**1.1** මූල්‍ය ප්‍රකාශනවල සංරචක පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දී තිබූ නමුත් සමහර අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දීමට අපොහොසත් වී තිබුණි.

**1.2** වත්කම් විකිණීම ගිණුම්කරණය සිදුකරන ආකාරය පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී. එමගින් විකිණීම මත ලාභය හෝ අලාභය ගණනය කරන්නේ කෙසේ දැයි පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දී තිබූ නමුත් සමහර අයදුම්කරුවන්ට නිවැරදි පිළිතුර දීමට අපොහොසත් විය.

**1.3** මෙම ප්‍රශ්නය මගින් සීමාසහිත පෞද්ගලික සමාගමක් පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු දී තිබූ නමුත් සමහරක් අයදුම්කරුවන්ට නිවැරදිව පිළිතුරු දීමට අපොහොත් විය.

**1.4** යලි ඇණවුම් මට්ටම ගණනය කිරීමට අවශ්‍ය වේ. යලි ඇණවුම් මටට්ටම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පිළිබඳව සෑහීමකට පත් විය හැකිය. මෙවැනි ගණනය කිරීම් කිරීමට ගණිතමය දැනුම වැඩි දියුණු කර ගැනීම අවශ්‍ය වේ.

**1.5** ණය මත පදනම්ව අමුද්‍රව්‍ය මිලට ගැනීමේ ද්විත්ව සටහන වාර්තා කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව ද්විත්ව සටහන හදුනා ගත් නමුත් ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසක් අවශ්‍ය කෙරෙන ද්විත්ව සටහන හඳුනාගෙන නොතිබුණි.

**1.6** 1890 හවුල් ව්‍යාපාර අඥා පනතේ 24 වගන්තියේ ප්‍රතිපාදන සඳහන් කිරීම අපේක්ෂිත වේ. අයදුම්කරුවන් බහුතරයක් නිවැරදිව පිළිතුරු දී තිබුණි.

**1.7** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ හවුල් කරුවෙකුගේ අයිතිවාසිකම් 3 ක් සඳහන් කිරීමට අපේක්ෂා කෙරේ. සමහරක් අයදුම්කරුවන් 1.6 ප්‍රශ්නයට දී තිබූ පිළිතුරු ද මෙම ප්‍රශ්ණයට ද දී ඇති බව නිරීක්ෂණය විය. නමුත් ප්‍රශ්න දෙක වෙනස් ප්‍රශ්න දෙකක් වන අතර වෙනස් පිළිතුරු අපේක්ෂිත වේ.

**1.8** මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැය ගිණුම්කරණය අතර වෙනස්කම් සඳහන් කිරීම අපේක්ෂිත වේ. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරව පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් හඳුනාගෙන තිබූ නමුත් සමහරක් අපේක්ෂිත පිළිතුර දීමට අපොහොසත් විය

**1.9** එකතු කළ අගය මත බදු පාලන ගිණුම (VAT) පිළියෙල කිරීම මත අයකරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන් බොහොමයක් නිවැරදිව පිළිතුරු දී තිබුණි. අයදුම්කරුවන් කිහිපයක් VAT පාලන ගිණුමේ හර සහ බැර සටහන් මාරුකර සටහන් කර තිබුණි.

**1.10** කැලි අනුපාත ක්‍රමය භාවිතා කරමින් සේවකයින්ගේ මුළු ඉපයීම් ගණනය කිරීම මත දැනුම පරීක්ෂාකරන ලදී. මෙම ප්‍රශ්නයේ කාර්යසාධනය දුර්වල විය. බොහෝ අයදුම්කරුවන් දිරි දීමනා ගෙවීම වැරදියට ගණනය කිරීම හේතුවෙන් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරිණි. හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවන්ගේ ජංගම ගිණුම හ ප්‍රාග්ධන ගිණුම පිළියෙල කිරීම අපේක්ෂා කෙරේ. හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුමේ අඩුකම නිරීක්ෂණය විය. ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් තුළ සටහන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් අයදුම්කරුවන්ට නොතිබුණි. එම නිසා බොහෝ අයදුම්කරුවන් ගැළපිලි වෙනස්කර සටහන් දක්වා තිබුණි. පහත සඳහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) කීර්තිනාමය සහ වත්කම් ප්‍රත්‍යගණනය, ප්‍රාග්ධන ගිණුම් වෙනුවට ජංගම ගිණුම තුළ සමහරක් අයදුම්කරුවන් ගලපා තිබුණි.

(2) සමහරක් අයදුම්කරුවන් ප්‍රාග්ධනය මත පොළිය සහ හවුල් කරුවන්ගේ වැටුප් හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළ වාර්තා කර තිබුණි.

(3) හවුල්කරුවන්ගේ විශ්‍රාම යාම සම්බන්ධයෙන් අදාල ගැළපිලි සමහර අයදුම්කරුවන් ඉටුකර නොතිබුණි. විශේෂයෙන් ජංගම ගිණුමේ ඉතිරි ශේෂය ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීම සබන්ධයෙන් සහ ඇයට ගෙවිය යුතු මුදල ණය ගිණුමට මාරු කිරීම සම්බන්ධයෙන් දැනුමේ අඩුකම නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

කේවල ස්වාමී ව්‍යාපාරයක් සඳහා අසම්පූර්ණ මූල්‍ය තොරතුරු මත පදනම්ව ශේෂ පිරික්සුම පිළියෙල කිරීම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරන ලදී. ගැනිලි ගැලපීම, මිලදී ගැනීමේ ගැලපීම, ආරම්භක සහ අවසාන තොගය, විකුණුම් පිරිවැය වැනි ගැලපීම් පිළිබඳ හොඳ අවබෝධයක් බොහෝ අයදුම්කරුවන්ට නොතිබූ බව නිරීක්ෂණය විය. තවද බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ආරම්භක ප්‍රාග්ධනය හඳුනා ගැනීමට අසමත් විය. එසේම සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ආදායම් ප්‍රකාශය, ශේෂ පිරික්සුම වෙනුවට පිළියෙල කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවිය.**

## ප්‍රශ්න අංක 04

ලාභය පදනම් කරනොගත් ආයතනයක ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරන ලදී. බොහෝ අයදුම්කරුවන් සාර්ථකව මෙම ප්‍රශ්නයට පිළිතුරු දී සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. න්‍යායායාත්ම දැනුම නොමැතිකමින් සමහර අයදුම්කරුවන් සාමාජික ගාස්තු ගිණුම සිදුනොකර තිබූ බව නිරීක්ෂණය විය. තවද ක්‍රීඩා භාණ්ඩ උපකරණ මත ක්ෂය ආදායම් සහ වියදම් ගිණුමේ මිල නිවැරදිව ගලපා නොතිබූ අතර මුළු සාමාජික ගාස්තු ආදායම නිවැරදිව ගණනය කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

**(a)** මෙම ප්‍රශ්නයේ මුළු පිරිවැය ගණනය පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී . බොහෝ අයදුම්කරුවන් වෙන් කළ සම්පූර්ණ ලකුණු 5 ම ලබාගෙන තිබූ නමුත් සමහර අයදුම්කරුවන්ට මුළු පිරිවැය යන සංකල්පය පිළිබඳ අවබෝධයක් නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**(b)** පිරිවැය ගිණුම්කරණය හා මූල්‍ය ගිණුම්කරණය අතර ලාභය සංසන්ධනය කිරීමේ ප්‍රකාශය පිළිබඳ දැනුම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. බෙහෝ අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු දී නොතිබූ අතර එසේම සම්පූර්ණ පිළිතුරක් දී නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් ලාභය සංසන්දනය යන සංකල්පය පිළිබඳ අවබෝධයක් නොතිබූ බව නිරීක්ෂණය විය. සමහරක් අයදුම්කරුවන් සංසන්ධනය වෙනුවට පිරිවැය ගිණුම්කරණය මත ලාභය හා මූල්‍ය ගිණුම්කරණය මත ලාභය අතර ගණිතමය වෙනස පමණක් පෙන්වා තිබුණි. ලාභය සංසන්ධනය කිරීමේ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ආරම්භක තොගය හා අවසාන තොගය බහුතරයක් නිවැරදිව ගලපා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවිය.**

## ප්‍රශ්න අංක 06

පොදු කාර්ය වෙන් කිරීම පිළිබඳ මූලික දැනුම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරල ලදී. දී ඇති තොරතුරු භාවිතා කරමින් පිරිවැය වෙන්කිරීමේ ප්‍රකාශය පිළියෙල කිරීම **(a) කොටසින්** අවශ්‍ය කෙරේ. බොහෝ අයදුම්කරුවන් එම කොටසට සාර්ථක ලෙස පිළිතුරු දී තිබූ නමුත් **(b)** සහ **(c) කොටස්** සඳහා කාර්යසාධනය සතුටුදායක නොවීය. බොහෝ අයදුම්කරුවන් ඇසුරුම් දෙපාර්තමේන්තුව සඳහා ඍජු ශ්‍රම පැයක පොදු කාර්යය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කිරීමට අසමත් වූ අතර ඒ හේතුවෙන් සනීපාරක්ෂක බෝතලයක ඇස්තමෙන්තු ගත මුළු පිරිවැය වැරදියට ගණනය කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය තරමක් සතුටුදායක මට්ටමක නොවිය.**

## C කොටස

### ප්‍රශ්න අංක 07

සීමාසහිත පෞද්ගලික සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කළ අතර **(a)** සහ **(b) කොටස්** ලෙස කොටස් දෙකකින් මන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම පරීක්ෂා කර තිබූ අතර මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කිරීම **(b) කොටසින්** පරීක්ෂා කරන ලදී.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දී තිබූ අතර අයදුම්කරුවන් කිහිපදෙනෙකුට පමණක් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හැකි විය.

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය:

**(a) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු අයිතම පිළිබඳ අවබෝධය අඩුකම හේතුවෙන් සමහර අයදුම්කරුවන් ඉඩම, ගොඩනැගිලි, මෝටර් වාහන, කාර්යාල උපකරණ වැනි මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තා කළ යුතු අයිතම සමහරක් අයදුම්කරුවන් සටහන් කර තිබුණි.

(2) මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පොදුවේ පිළිගත් ආකෘති සමහර අයදුම්කරුවන් විසින් අනුගමනය කර නොතිබුණි.

(3) ආදායම් බදු ගැලපිල්ල බොහෝ අයදුම්කරුවන් පෙර වැඩවල පෙන්වා නොතිබූ අතර බොහෝ දෙනා වර්ෂයට අදාල ආදායම් බද්ද නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) ණයකර පොළිය, විකුණුම් කොමිස් වියදම් වුවත් සමහර අයදුම්කරුවන් වෙනත් ආදායම් ලෙස සලකා තිබුණි.

(5) බොහෝ අයදුම්කරුවන් ණයකර පොළිය නිවැරදිව ගණනය කර නොතිබුණි. ඔවුන් වර්ෂය සඳහා පොළිය ගණනය කර නොතිබුණු අතර ගෙවූ පොළිය පමණක් සලකා තිබුණි.

(6) අඩමාන ණය සඳහා 10% පොදු ප්‍රතිපාදනය, රු.2,300,000 ක බොල් ණය අඩුකර ඉතිරි ණයගැතියන් මත කළ යුතු වුවත් සමහරක් අයදුම්කරුවන් එය අමතක කොට අඩු කිරීමට පෙර ණයගැති ශේෂය මත අඩමාන ණය ප්‍රතිපාදනය සිදු කොට තිබුණි.

(7) ගෙවිය යුතු මුදල් සහ කලින් ගෙවීම සමහරක් අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදිව පෙන්වා නොතිබුණි.

(8) සමහරක් අයදුම්කරුවන් වර්ෂය සඳහා ක්ෂය වෙනුවට සමුච්චිත ක්ෂය ආදායම් ප්‍රකාශයේ පෙන්වා තිබුණි.

(9) සමහරක් අයදුම්කරුවන් පෙර වැඩ පෙන්වා නොතිබූ අතර පෙර වැඩ වෙනුවෙන් වෙන්කළ ලකුණු ලබාගෙන නොතිබුණි.

(10) බොහෝ අයදුම්කරුවන් අවසාන තොග ගැලපීම නිවැරදිව සිදුකොට නොතිබුණි.

(11) බොහෝ අයදුම්කරුවන් ගෘහ භාණ්ඩ මත ක්ෂය ගලපා නොතිබුණි. ගෘහ භාණ්ඩ මිලදී ගත් දිනය නොසලකා වර්ෂය සඳහා ක්ෂය ගණනය කර තිබුණි.

(12) පරිපාලන වියදම් සහ බෙදා හැරීම් වියදම් සඳහා විස්තරාත්මක පෙරවැඩ සමහර අයදුම්කරුවන් පෙන්වා නොතිබුණි.

(13) සමහර අයදුම්කරුවන් සමහර අගයන් දහස්වලින් පෙන්වා තිබූ අතර සමහර අගයන් දහස් අගයන්ට නොගෙන සලකා තිබුණි.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීම:**

(1) සමහර අයදුම්කරුවන් ගොඩනැගිලි ක්ෂය ගණනය කිරීමේදී ඉඩමේ අගය අඩු කර නොතිබුණි.

(2) උපචිත විදුලිය සහ කලින් ගෙවූ නඩත්තු වියදම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ නිවැරදිව වාර්තා කොට නොතිබුණි.

(3) බොල් ණය ලියා හැරීම සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය නිවැරදිව ගණනය කොට නොතිබුණි. සමහර අයදුම්කරුවන් බොල් ණය ලියා හල අගය අඩු කර නොකර අඩමාන ණය ප්‍රතිපාදනය පමණක් ගණනය කොට නොතිබුණි.

(4) සමහරක් අයදුම්කරුවන් ඉඩම් සහ ගොඩනැගිලිවල සමුච්චිතක්ෂය අගය නිවැරදිව පෙන්වා නොතිබුණි.

(5) බෙහෝ අයදුම්කරුවන් ගෙවිය යුතු ආදායම් බද්ද නිවැරදිව පෙන්වා නෙතිබුණි.

(6) බොහෝ අයදුම්කරුවන්, රඳවා ගත් ඉපයීම්වලින් පොදු සංචිතයට මාරුකළ යුතු රු.10,000,000 නිවැරදිව වාර්තා කොට නොතිබුණි. ඔවුන් ඒවා ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩුකර තිබුණි.

(7) බොහෝ අයදුම්කරුවන් අවසාන තොගයේ හානි වූ තොගය අඩුකර නොතිබුණි.

(8) බොහෝ අයදුම්කරුවන් ගෙවූ අතුරු ලාභාංශ නිවැරදිව ගලපා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම වැඩිදියුණු කිරීම සඳහා සැලකිලිමත්විය යුතු පොදු කරුණු:**

(1) පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.

(2) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය මත පදනම්ව, වැයකළ හැකි කාලය ඇස්තමේන්තු කිරීම මඟින් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.

(3) ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(4) ප්‍රශ්නය කිහිපවරක් කියවා අසා ඇති දේවල්වලට පමණක් උත්තර ලිවීම, අනවශ්‍ය දේවල් ලිවීමට කාලය නාස්ති නොකිරීම, පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.

(5) අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතු අතර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.

(6) මෙම මට්ටම සඳහා අදාල ගිණුම්කරණ ප්‍රමිත හොඳින් අධ්‍යයනය කිරීම. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම් මාලා පොත් සහ අනෙකුත් ලේඛන පරිශීලනය කිරීම.

(7) ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.

(8) උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍යකරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

(9) විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් විභාගයට මුහුණ දීම.

- * * * -